සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

# ක්‍රිස්තියානි ධර්මය I
# கிறிஸ்தவம் I
# Christianity I

**43 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:

- ✻ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✻ පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ.
- ✻ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ **ඔබේ විභාග අංකය** ලියන්න.
- ✻ උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ✻ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පසුපස දක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොද දක්වන්න.

1. ශුද්ධ බයිබලයේ පොත් ගණනාවක් ඇතුළත් වුව ද, එය එක පොතක් වන්නේ,
   (1) එය පොතකට වඩා පුස්තකාලයක් බැවිනි.
   (2) එහි පුරාණ ගිවිසුම හා නව ගිවිසුම යන දෙක ම අඩංගු බැවිනි.
   (3) එහි ඊශ්‍රායෙල් ඉතිහාසය අනාවරණය වන බැවිනි.
   (4) එය විවිධ භාෂාවලට පරිවර්තනය වී ඇති බැවිනි.
   (5) එහි එක තේමාවක් දිව යන බැවිනි.

2. ශුද්ධ බයිබලය ලේඛනගත කළ කාලපරිච්ඡේදය වනුයේ,
   (1) ක්‍රි. පූ. 950 - ක්‍රි. පූ. 100 දක්වා
   (2) ක්‍රි. පූ. 60 - ක්‍රි. පූ. 100 දක්වා
   (3) ක්‍රි. පූ. 950 - ක්‍රි. ව. 100 දක්වා
   (4) ක්‍රි. පූ. 900 - ක්‍රි. පූ. 100 දක්වා
   (5) ක්‍රි. ව. 1 - ක්‍රි. ව. 60 දක්වා

3. ශුද්ධ බයිබලය පළමුවෙන් ලේඛන ගත වී ඇත්තේ .............................. වල ය. හිස්තැනට යෝග්‍ය පිළිතුර තෝරන්න.
   (1) ගල් පුවරු (2) පැපිරස් (3) හම් (4) කඩදාසි (5) හැකුළුම් පත්

4. 'සරු අඩ සඳ' නමින් හැඳින්වූ ප්‍රදේශය වනුයේ,
   (1) මිසරයේ සිට බැබිලෝනියා දක්වා (2) මිසරයේ සිට පලස්තීනය දක්වා
   (3) මිසරයේ සිට ආසියාව දක්වා (4) මිසරයේ සිට ගලීලය දක්වා
   (5) ජෝර්දනයේ සිට කානානිය දක්වා

5. පර්සියාවේ දරියුස් රජ සමයේ දී ජුද ජනතාව ව්‍යවස්ථාව නොතකා පිරිහෙමින් සිටිය දි ඔවුන් විනයගරුක ජනතාවක් කිරීමට මූලික වූයේ,
   (1) දෙබෝරා (2) සාමුවෙල් (3) එස්රා (4) සයිරස් (5) එපිපානිස්

6. දූවිල්ලෙන් මිනිසා මැවීම තුළ කුමක් සංකේතවත් කරයි ද?
   (1) වටිනාකමින් අඩු බව
   (2) මිනිසා දෙවියන් නො වන බව
   (3) ජීවිතයේ අභිරහස් බව
   (4) දෙවියන් වහන්සේගේ සර්ව බලධාරී බව
   (5) මිනිසා භූමියට පමණක් සම්බන්ධ බව.

7. "තුඹ යම් දවසක මේ ගසින් කන්නෙහි ද ඒ දවසෙහි දී නුඹේ මරණය ඒකාන්තයි." මෙහි 'මරණය' යනුවෙන් හඳුන්වන්නේ,
   (1) මානව සම්බන්ධතාව බිඳ වැටීම ය.
   (2) භෞතික සම්බන්ධතාව බිඳ වැටීම ය.
   (3) නිර්මල පැවැත්ම නැති වී යාම ය.
   (4) දේව සම්බන්ධතාව බිඳ වැටීම ය.
   (5) ප්‍රඥාවන්තභාවයට ළඟාවීමට ඉඩ නොතිබීම ය.

[ දෙවෙනි පිටුව බලන්න.

8. ගිවිසුමේ බාහිර සලකුණක් මෙන් ම ප්‍රසාද ස්නාපනයේ පෙර සලකුණක් ලෙස සැලකෙන්නේ,
   (1) තෙලයෙන් අභිෂේක කිරීම ය.
   (2) දේව මාලිගාවේ කැප කිරීම ය.
   (3) කුළුදුල් දරුවන් දේව පූජාවක් සේ පිදීම ය.
   (4) සතුන්ගේ ලේ පූජාසනය මත ඉසීම ය.
   (5) චර්මඡේදනය කිරීම ය.

9. ආබ්‍රහම්තුමා ඊශ්‍රායෙල් ඉතිහාසයේ යුග පුරුෂයකු ලෙස පිදුම් ලබන්නට බල පෑ හේතු සාධකය වූයේ,
   (1) සියල්ල අතහැර කානාන් දේශයට යාම ය.
   (2) බහු දේව වාදයෙන් ඒක දේව වාදයට යොමු කිරීම ය.
   (3) තම ජීවිතය මෙහෙයවීමේ අයිතිය දෙවිඳුන්ට ලබා දීම ය.
   (4) සියලු අභියෝග ජය ගැනීමේ සහජ දක්ෂතාව ය.
   (5) තම පුත් ඊසාක්, පූජා කිරීමට සැරසීම ය.

10. ඊසාක් ක්‍රිස්තුස් වහන්සේගේ පෙර සලකුණක් වන්නේ,
   (1) ඔහු ආබ්‍රහම්ගේ පුත්‍රයා වීම ය.
   (2) ඔහු දේශයේ උරුමකරු වීම ය.
   (3) ඔහු පූජා වීමට සූදානම් වීම ය.
   (4) ඔහු නිර්දෝෂී වුවත් ජීවිත පූජාවකට ගෙන යාම ය.
   (5) ඔහු දේව දූත දර්ශනය තුළින් ගලවා ගැනීම ය.

11. ආබ්‍රහම්ගේ කැඳවීමේ ප්‍රධාන ලක්ෂණ දෙකකි. ඉන් එකක් වන්නේ,
   (1) පරිත්‍යාගය (2) ආදරය (3) රැකවරණය (4) කැපවීම (5) බලාපොරොත්තුව

12. "මම වනාහි ස්වයංභූ නම් තැනැත් වහන්සේ වෙමි," යනුවෙන් අනාවරණය කළ දේව නාමයට වඩා ගැළපෙන අර්ථය වනුයේ,
   (1) උත්තරීතර, අසීමිත හා එක ම දෙවියන් වහන්සේ බව ය.
   (2) ඊශ්‍රායෙල්වරුන්ගේ සැබෑ එක ම දෙවියන්වහන්සේ බව ය.
   (3) තෝරාගත් ජනතාවගේ දෙවියන් වහන්සේ වන බව ය.
   (4) යාවේ දෙවියන් වහන්සේ හැර වෙනත් දෙවි කෙනකු නැති බව ය.
   (5) ඊශ්‍රායෙල්වරුන්ට විමුක්තිය ලැබෙන්නේ දෙවියන් වහන්සේගෙන් බව ය.

13. පුරාණ ගිවිසුමට අනුව "බොදුන" සංකේතවත් කරනුයේ,
   (1) සාමූහිකත්වය හා සහජීවනයයි. (2) සාමූහිකත්වය හා ප්‍රේමයයි.
   (3) සහජීවනය හා දයාවයි. (4) සාමය හා සමගියයි.
   (5) එකමුතුකම හා තෘප්තියයි.

14. ජනතාව රාජකීය, පූජක, ශුද්ධවූ ජනතාවක් කිරීම .................... ගිවිසුමේ පරමාර්ථය විය.
   හිස්තැනට යෝග්‍ය වචනය තෝරන්න.
   (1) ආබ්‍රහම්ගේ (2) ආදි මවුපියන්ගේ (3) සීනයි (4) නෝවාගේ (5) ජාකොබ්ගේ

15. දෙවියන් වහන්සේගේ පණිවිඩය සෘජුව ජනතාවට ප්‍රකාශ කළේ,
   (1) ප්‍රජාමූලිකයෝ ය. (2) රජවරු ය. (3) පූජකවරු ය. (4) දිවැසිවරු ය. (5) ආදිපීතෘවරු ය.

16. ජෙරමියා යන නාමයේ අර්ථය වනුයේ දෙවියන් වහන්සේ විසින්,
   (1) කැඳවනු ලැබීම ය. (2) තෝරාගනු ලැබීම ය.
   (3) උසස් කරනු ලැබීම ය. (4) නායකත්වය සඳහා තෝරාගනු ලැබීම
   (5) ප්‍රතික්ෂේප කරනු ලැබීම ය.

17. මෙසියානු සංකල්පය ඉදිරිපත් කළ දිවැසිවරුන් දෙදෙනකු වන්නේ,
   (1) ජෙරමියා සහ එසකියෙල් ය. (2) යෙසායා සහ මීකා ය.
   (3) එසකියෙල් සහ මීකා ය. (4) යෙසායා සහ ජෙරමියා ය.
   (5) සාමුවෙල් සහ ආමොස් ය.

18. පලස්තීනයේ පොදු ජනතාව මත පනවා තිබූ බද්දකි,
   (1) එඩේරික බද්ද (2) ඉඩම් බද්ද
   (3) පුද්ගල බද්ද (4) වහල් බද්ද
   (5) දේවස්ථාන බද්ද

[ තුන්වෙනි පිටුව බලන්න.

19. ඊශ්‍රායෙල් ජනතාව දේව ගිවිසුම උල්ලංඝණය කළ නිසා ඔවුන් ලද දඬුවම වූයේ,
    (1) දේව සම්මුඛයෙන් නෙරපා හැරීමයි.
    (2) පොරොන්දු දේශය අහිමි වීමයි.
    (3) විප්‍රවාසීව සිටීමට සිදු වීමයි.
    (4) "තෝරාගත් සෙනඟ" යන නාමයෙන් ඉවත් වීමයි.
    (5) විශ්වාසය කඩ කළ පිරිසක් වීමයි.

20. වරදකරුවකු කුරුස පත් කිරීමට අණ දීමේ බලය පැවරී තිබුණේ,
    (1) රෝම ආණ්ඩුකාරයාට ය.  (2) නායක පූජකයන්ට ය.
    (3) රෝම අධිරාජ්‍යයාට ය.  (4) සැන්හෙඩ්‍රින් සභාවට ය.
    (5) හේවායන්ට ය.

21. දේව රාජ්‍ය හා දේව රාජ්‍යයට ඇතුළුවීමට සුදුසුකම් කවරේ ද යන්න ක්‍රිස්තුස් වහන්සේ ප්‍රකාශ කළේ,
    (1) උත්තම පූජක යාච්ඤාවෙනි.  (2) වපුරන්නා පිළිබඳ උපමාවෙනි.
    (3) අන්තිම රාත්‍රී භෝජනයේදී ය.  (4) එම්මාවුස් ගමනේදී ය.
    (5) කන්ද උඩ දේශනාවෙනි.

22. ක්‍රිස්තුස් වහන්සේ මෙලොවෙහි උද කළ දේව රාජ්‍ය සම්පූර්ණත්වය කරා ගෙන යාමේ කාර්යය පැවරුවේ,
    (1) දේව මාතාවන්ට ය.  (2) ශුද්ධවූ සභාවට ය.
    (3) ගෝලයන් හැත්තෑ දෙනාට ය.  (4) විජාතිකයන්ට ය.
    (5) පේදුරු සහ පාවුළුට ය.

23. දේව රාජ්‍යය අත්පත් කර ගනු සඳහා අත්‍යවශ්‍ය සාධකයකි,
    (1) බලාපොරොත්තුව  (2) ප්‍රේමය
    (3) සහෝදර දයාව  (4) මනස්ථාපනය
    (5) ධර්මිෂ්ඨකම

24. යහපත් දිවි පැවැත්මකට අපව යොමු කරන උපමාව වන්නේ,
    (1) දැළ පිළිබඳ උපමාව ය.  (2) නිධානය පිළිබඳ උපමාව ය.
    (3) අබ ඇටය පිළිබඳ උපමාව ය.  (4) මුතු ඇටය පිළිබඳ උපමාව ය.
    (5) විවාහ මංගල භෝජනය පිළිබඳ උපමාව ය.

25. මතෙව් සුබ අස්නේ ඉගැන්වීම්වල තේමාව වන්නේ,
    (1) දේව රාජ්‍යය ය.  (2) සදතන ජීවිතය ය.
    (3) ප්‍රේමය ය.  (4) මෙසියස් ජේසුස් වහන්සේ බව ය.
    (5) සුබ වදන ය.

26. උත්තම පූජක යාච්ඤාව හා ස්වාමිවාක් ආරාධනය අතර සමාන ලක්ෂණය වන්නේ,
    (1) දිනපතා භෝජනය වෙනුවෙන් යැදීම ය.  (2) රටට සාමය පතා යැදීම ය.
    (3) සභා ඒකත්වය පිණිස යැදීම ය.  (4) නපුරාගේ බලයෙන් මුදන පිණිස යැදීම ය.
    (5) ස්වකීයයන් වෙනුවෙන් යැදීම ය.

27. ශුද්ධෝත්තම පියතුමාගේ අධිකාරිය, නොවරදින සුළුභාවය සහ නායකත්වය පිළිබඳ ස්ථාවරය ගනු ලැබූ මන්ත්‍රණ සභාව වන්නේ,
    (1) නිසියානු මන්ත්‍රණ සභාව ය.  (2) එපිස මන්ත්‍රණ සභාව ය.
    (3) ත්‍රිදෙන්තීන මන්ත්‍රණ සභාව ය.  (4) පළමුවන වතිකාන මන්ත්‍රණ සභාව ය.
    (5) දෙවන වතිකාන මන්ත්‍රණ සභාව ය.

28. විජාතීන් මුල් කිතුනු සභාවට ඇතුළුවීම ආරම්භ වූයේ,
    (1) ශතාධිපති කොරනේලියස්ගේ සිත් හැරීමෙන් පසු ය.
    (2) සාවුළු දමස්කයේ දී සිත් හැරීමෙන් පසු ය.
    (3) පෙන්තකොස්ත දින ශුද්ධාත්ම ආගමනයෙන් පසු ය.
    (4) ස්තේපන්තුමාගේ ජීවිත පරිත්‍යාගයෙන් පසු ය.
    (5) පේදුරුතුමාගේ පළමු දේශනයෙන් පසු ය.

29. පිලිප්පි 2 : 5-11 ලිපියෙන් පෙන්වා දෙන ක්‍රිස්තු ජීවිතයේ කැපී පෙනෙන ගුණාංග වන්නේ,
    (1) පාරිශුද්ධතාව හා කීකරුකම ය.  (2) බැහැපත්කම හා ප්‍රේමය ය.
    (3) බැහැපත්කම හා කීකරුකම ය.  (4) ප්‍රේමය හා කීකරුකම ය.
    (5) දිළිඳුකම හා කීකරුකම ය.

3130

30. ඇතන්ස් නුවර දී ශුද්ධ වූ පාවුළු තුමාගේ සිත කැළඹීමට හේතු වූයේ,
   (1) එම නගරවාසීන් ඔවුන්ට විරුද්ධ වූ නිසා ය.
   (2) එම නගරයේ බොහෝ උගතුන් සිටි නිසා ය.
   (3) එම නගරවාසීන්ගේ ගැඹුරු විශ්වාසය නිසා ය.
   (4) එම නගරය වෙනත් ජාතීන් නො පිළිගත් නිසා ය.
   (5) එම නගරය දේව රූපවලින් පිරී තිබූ නිසා ය.

31. නව ගිවිසුම තුළ ගැලවීමේ විශ්වීය බව සඳහන් කරන්නේ,
   (1) ශුද්ධ වූ ලූක්තුමා ය.
   (2) ශුද්ධ වූ පේදුරුතුමා ය.
   (3) ශුද්ධ වූ ජොහාන්තුමා ය.
   (4) ශුද්ධ වූ ජාකොබ්තුමා ය.
   (5) ශුද්ධ වූ මාක්තුමා ය.

32. පිළිම වන්දනාවට එරෙහිව පාවුළුතුමා දේශනා කළේ කිනම් ධර්ම දූත චාරිකාවකදී ද?
   (1) පළමු චාරිකාවේදී ය.
   (2) දෙවන චාරිකාවේදී ය.
   (3) තුන්වන චාරිකාවේදී ය.
   (4) පළමු සහ දෙවන චාරිකාවල ය.
   (5) දෙවන සහ තුන්වන චාරිකාවල ය.

33. සභා පියවරුන්ගේ ප්‍රධාන කාර්යය වූයේ,
   (1) තර්ක කිරීමයි.
   (2) පූජා කැඩීමයි.
   (3) ඉගැන්වීමයි.
   (4) දයාවේ සේවයයි.
   (5) ධර්ම දූත චාරිකාවල යෙදීමයි.

34. ශුද්ධ බයිබලයේ උපකාරක කර්තෘගේ කාර්යභාරය වූයේ
   (1) නිර්මාණකරණය කිරීමයි.
   (2) ස්වකීය බලයෙන් ක්‍රියා කිරීමයි.
   (3) දේවානුභාවය තුළ ක්‍රියා කිරීමයි.
   (4) ප්‍රධාන කර්තෘ බවට පත් වීමයි.
   (5) මෙහෙයවමින් ක්‍රියා කිරීමයි.

35. එකොළොස්වන සියවස තුළ සභා ඉතිහාසයේ සිදු වූ අවාසනාවන්ත සිදු වීම වන්නේ,
   (1) මාක්ස්වාදය ඇති වීම ය.
   (2) ඒරියන්වාදය ඇති වීම ය.
   (3) සභා භේදය ඇති වීම ය.
   (4) ඩොනටිස්වාදය ඇති වීම ය.
   (5) පෙලාජියන්වාදය ඇති වීම ය.

36. "දේව ධර්මය යනු අවබෝධය සොයා යන ඇදහිල්ලකි." මෙලෙස හඳුන්වා දෙනු ලැබුවේ,
   (1) කැන්ටබරි හි ශුද්ධ වූ ඇන්ස්ලම්තුමා ය.
   (2) පීටර් ලොම්බාට්තුමා ය.
   (3) තාගස්හි ශුද්ධ වූ රොබට්තුමා ය.
   (4) මොලෙස්වාසි ශුද්ධ වූ රොබට්තුමා ය.
   (5) කොන්ස්තන්තිනෝපල් හි ආදි පීතෘතුමා ය.

37. මධ්‍යතන යුගයේ දී ක්‍රිස්තියානි කැටයම් කලාව යොදා ගෙන ඇත්තේ,
   (1) ගෘහ නිර්මාණ ශිල්පයේ උන්නතිය සඳහා ය.
   (2) දේවස්ථාන ගොඩනැගිලි සරසන ක්‍රමයක් ලෙස ය.
   (3) සංස්කෘතික වටිනාකම් තුළින් දෙවියන් ඇදහීම ය.
   (4) කැටයම් ශිල්පයේ අත්හද බැලීම් සඳහා ය.
   (5) දේවස්ථාන ගොඩනැගිලිවල හිස්තැන් පිරවීම සඳහා ය.

38. පිලිප්පුස් බල්දේවුස් දේවගැතිතුමාගෙන් සිදු වූ සුවිශේෂී මෙහෙවරක් වන්නේ,
   (1) කැතිකිස්තවරුන් (ආගමික උපදේශකවරුන්) පුහුණු කිරීම ය.
   (2) මීසම් පාලනය සංවිධානය කිරීම ය.
   (3) වතුකරයේ ධර්ම දූත කටයුතු ව්‍යාප්ත කිරීම ය.
   (4) 'මැග්නා කාර්ටා' පනත සැකසීමට දායක වීම ය.
   (5) සෞඛ්‍ය සේවයෙහි නියුක්ත වීම ය.

39. ශ්‍රී ලංකාවේ ඉපැරණිතම සභාරාව 'භක්ති ප්‍රබෝධනය' ආරම්භ කිරීමට පුරෝගාමී වූ පැවිදි නිකාය වන්නේ,
   (1) ජේසු නිකාය ය.
   (2) දෙමිනිකාන නිකාය ය.
   (3) සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකාය ය.
   (4) නිමල මරිය නිකාය ය.
   (5) ප්‍රන්සිස්කාන නිකාය ය.

40. මෙරට කතෝලික සසුනේ ව්‍යාප්තිය සඳහා ප්‍රථම වතාවට පැමිණි පැවිදිවරියන්ගේ නිකාය වන්නේ,
   (1) ප්‍රන්සිස්කාන සොයුරියෝ
   (2) දේව ආරක්ෂාවේ සොයුරියෝ
   (3) අපෝස්තලික කාර්මේල් සොයුරියෝ
   (4) සදසරණ සොයුරියෝ
   (5) ශුද්ධවූ පවුලේ සොයුරියෝ

41. උපකෘත පාසල් අන්‍යාගමිකයන් අතර පවා ජනප්‍රිය වීමට හේතු වූයේ,
   (1) ළමා කුසලතා එළි දක්වීමට පරිසරය තිබීම නිසා ය.
   (2) විනය, පිළිවෙළ හා අධ්‍යාපන ක්‍රමවේදය නිසා ය.
   (3) ඉංග්‍රීසි භාෂාවට පමණක් මුල් තැන දීම නිසා ය.
   (4) විෂය සමගාමී ක්‍රියාකාරකම් බොහොමයක් තිබීම නිසා ය.
   (5) ආගමික පරිසරයක් තුළ අධ්‍යාපනය දීම නිසා ය.

42. සභා ඉතිහාසයේ නවෝදයකට මං හෙළි කළ සංධිස්ථානයක් වනුයේ,
   (1) පළමුවන වතිකාන මන්ත්‍රණ සභාව ය.
   (2) මාටින් ලූතර්ගේ විප්ලවය ය.
   (3) නිසියානු මන්ත්‍රණ සභාව ය.
   (4) දෙවන වතිකාන මන්ත්‍රණ සභාව ය.
   (5) එපිසියේ මන්ත්‍රණ සභාව ය.

43. දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ තීරණ ක්ෂණික බලපෑමක් ඇති කළේ,
   (1) ජන වන්දනාව කෙරෙහි ය.
   (2) ශීල ධර්ම කෙරෙහි ය.
   (3) ආගමික සුහදතාව කෙරෙහි ය.
   (4) පැවිදි නිකායන් කෙරෙහි ය.
   (5) ගිහි සංචිත කෙරෙහි ය.

44. ඉතිහාසයේ සභා බෙදීම් සිදු වූයේ,
   (1) දේව අභිප්‍රාය නිසා ය.
   (2) අධිරාජ්‍යවාදී බලපෑම් නිසා ය.
   (3) මිනිස් දුබලකම් හා වැරදි නිසා ය.
   (4) ශුද්ධෝත්තම පියතුමාගේ නො වරදින සුළු භාවය නිසා ය.
   (5) වේද සත්‍යතාවයන්වල බලපෑම් නිසා ය.

45. අන්තර් ආගමික සංවාදය යනුවෙන් අදහස් කරනුයේ,
   (1) වේද භේද පිළිබඳ සාකච්ඡාව පැවැත්වීම ය.
   (2) සර්ව ආගමික වත්පිළිවෙත් පැවැත්වීම ය.
   (3) ජාතික ගැටලු හමුවේ ඒකීය තීරණ ගැනීම ය.
   (4) විවිධ ආගමිකයන් අතර සහජීවනය ඇති කිරීම ය.
   (5) ආගමික අනන්‍යතාව තහවුරු කිරීම ය.

46. නිදහසින් පසු ශ්‍රී ලාංකේය සභාව මුහුණ දුන් ප්‍රධාන ගැටලුව වන්නේ,
   (1) විදේශීය ධර්ම දූතවරුන් රටින් පිටුවහල් කිරීම ය.
   (2) පාසල් රජයට පවරා ගැනීම ය.
   (3) කෝල්බෲක් කොමිෂම් වාර්තාවේ අහිසි බලපෑම් ය.
   (4) ජනවන්දනාව දේශීයකරණය වීම ය.
   (5) ක්‍රියාකාරී දේශපාලනයේ කිතුනු දායකත්වය මඳ වීම ය.

47. දමිළ කතෝලික 'නාට්ටුකුත්තු කලාව' තුළ දුක් විඳීම ප්‍රධාන තේමාව වූයේ,
   (1) යුරෝපීය ජන කතා පදනම් කරගෙන ඇති නිසා ය.
   (2) සාන්තුවර චරිත පදනම් වී ඇති නිසා ය.
   (3) කිතු දහමේ හරය ජනතාවට ගෙන යාමට ඇති නිසා ය.
   (4) කිතුනුවන් ලන්දේසි පීඩනයට මුහුණ දෙමින් සිටි නිසා ය.
   (5) කතෝලික නාට්‍යවලට ප්‍රබල විරෝධතා ඇති වීම නිසා ය.

48. සභාවේ මුල් යුගයේ කිතුනුවන්ට පීඩා කිරීමට ප්‍රධාන හේතුවක් වූයේ,
   (1) ඔවුන්ගේ රහසිගත යාච්ඤා ය.
   (2) ඔවුන්ගේ ගැඹුරු ඇදහිල්ල ය.
   (3) ඔවුන් සභා නායකයින්ට කීකරුවීම ය.
   (4) ඔවුන්ගේ නිහඬ ජීවිතය ය.
   (5) ක්‍රිස්තු උත්ථානය පිළිබඳ ඉගැන්වීම ය.

49. අපෝස්තලික යුගයේ දී පව් කමාව ලබා ගැනීම සඳහා අත්‍යවශ්‍ය කරුණකි,
   (1) පව් නො කිරීමට පොරොන්දු වීම
   (2) එදිරිවාදිකම් කළ අයගෙන් සමාව ඉල්ලීම
   (3) ළයට තෙවරක් ගසා ගැනීම
   (4) පූජ කැඩීමේ පිළිවෙතට සම්බන්ධ වීම
   (5) පශ්චත්තාපය වී පාපොච්චාරණය කිරීම

50. මානව සංවර්ධනය, යහ පැවැත්ම සහ සමාජ උන්නතිය සඳහා තියැලීමට කිතුනුවා ප්‍රායෝගික ජවයක් ලබන්නේ,
   (1) කිතුනු ජන වන්දනාවට ක්‍රියාකාරීව සහභාගී වීමෙනි.
   (2) සමාජ සුබ සාධක කටයුතු කිරීමෙනි.
   (3) කිතුනු යාච්ඤා ජීවිතයෙනි.
   (4) දේශපාලන ක්ෂේත්‍රයට සහභාගී වීමෙනි.
   (5) යහපත් පවුල් ජීවිතයක් ගත කිරීමෙනි.

***

3122

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ක්‍රිස්තියානි ධර්මය II
கிறிஸ்தவம் II
Christianity II

43 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

උපදෙස්:

※ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) ශුද්ධ බයිබලයේ උපකාරක කර්තෘ ක්‍රියා කළ ආකාරය කරුණු **හතරකින්** පෙන්වා දෙන්න.
   (ii) දේවානුභාවය දෙවියන් වහන්සේ විසින් දනය කරන ලද විශේෂ දීමනාවක් බව කරුණු **හතරකින්** පෙන්වා දෙන්න.
   (iii) ගලීල ප්‍රදේශය ආශ්‍රිතව සිදු වූ ප්‍රධාන සිද්ධීන් **හතරක්** නම් කරන්න.
   (iv) පොරොන්දු දේශයට පැමිණි පසුව දෙවියන් වහන්සේ දේව ජනතාවට මගපෙන්වීමට තෝරා ගත් නායකයින්ට ඉටු කිරීමට සිදු වූ විශේෂ කාර්යයන් **හතරක්** දක්වන්න.
   (v) පංච පුස්තකය තුළ ඇතැම් අවස්ථාවල එකම සිද්ධිය නැතහොත් කතා පුවත දෙවතාවක් හෝ කිහිප වතාවක් ම එකිනෙකට වෙනස් අයුරින් ඇති බව දක්වීමට නිදසුන් **හතරක්** සඳහන් කරන්න.
   (ලකුණු $4 \times 5 = 20$ යි)

2. (i) පංච පුස්තකය තුළ ඇති ධාර්මික තේමා **හතරක්** නම් කරන්න.
   (ii) දෙවියන් වහන්සේ මෝසෙස්ව නායකත්වයේ අභියෝග හමුවේ ශක්තිමත් කළ අවස්ථා **හතරක්** නම් කරන්න.
   (iii) දස පනතේ විශේෂ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.
   (iv) දිවැසිවරුන් සතු ගුණාංග **හතරක්** සඳහන් කරන්න.
   (v) ඊශ්‍රායෙල් දිවැස්ප්‍රසාදිවරුන්ට පැවරුණු කාර්යයන් **හතරක්** දක්වන්න.
   (ලකුණු $4 \times 5 = 20$ යි)

3. (i) මෙසියස්තුමාගේ සුලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.
   (ii) ක්‍රිස්තුස් වහන්සේගේ කාලයේ පලස්තීනයේ ජීවත් වූ විවිධ ආගමික කණ්ඩායම් **හතරක්** නම් කරන්න.
   (iii) ජුදෙව්වරුන් පැවැත් වූ විශේෂ මංගල්‍යයන් **තුන** නම් කර එයින් **එකක්** කෙටියෙන් විස්තර කරන්න.
   (iv) පාවුළු තුමාගේ දෙවන ධර්ම දූත චාරිකාවේදී පිලිප්පියේ සිදු වූ වැදගත් සිදුවීම් **හතරක්** සඳහන් කරන්න.
   (v) මුල් කිතුනු ලේඛකයකු හෝ සභා පියෙකු නම් කිරීමේ දී සලකා බැලිය යුතු කරුණු **හතර** කුමක් ද?
   (ලකුණු $4 \times 5 = 20$ යි)

## II කොටස

4. (i) ශුද්ධ වූ ජොහාන් සුවිශේෂයේ කර්තෘත්වය හා පරමාර්ථය කරුණු **පහකින්** විස්තර කරන්න. (ලකුණු 10 යි)
   (ii) ශුද්ධවූ ජොහාන් සුවිශේෂයේ දේව රාජ්‍යයේ සලකුණු (ප්‍රාතිහාර්යයන්) **පහක්** සඳහන් කර ඉන් **එකක්** වචන 60 කින් පමණ විස්තර කරන්න. (ලකුණු 10 යි)

5. (i) ජුදෙව් පසුබිම තුළ කිතුනු සභාවේ උපත සිදු වූ ආකාරය පෙන්තකොස්ත සිද්ධිය ඇසුරෙන් කරුණු **පහකින්** විස්තර කරන්න. (ලකුණු 10 යි)
   (ii) "මුල් කිතුනුවන්ගේ ජීවිත පැවැත්ම වත්මන් කිතුනුවන්ට අභියෝගයකි." කරුණු **පහක්** ඉදිරිපත් කරමින් මෙය සනාථ කරන්න. (ලකුණු 10 යි)

6. (i) නිසියාන මන්ත්‍රණ සභාව පැවැත්වීමට හේතුව කෙටියෙන් ඉදිරිපත් කර එම මන්ත්‍රණ සභාව විනය නීති රීති පිළිබඳව ගත් තීරණ **පහක්** සඳහන් කරන්න. (ලකුණු 10 යි)
   (ii) නිසියාන මන්ත්‍රණ සභාව පැවැත්වීමෙන් කතෝලික සභාවේ බලාපොරොත්තු කෙතෙක් දුරට සාර්ථක වූයේ දැයි වචන 100 කින් පමණ පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

7. (i) පෘතුගීසින් පැමිණීමට පෙර ශ්‍රී ලංකාවේ කිතු දහම පැවැති බව උදාහරණ ඉදිරිපත් කරමින් වචන 100 කින් පමණ සනාථ කරන්න. (ලකුණු 10 යි)
   (ii) පෘතුගීසි ධර්මදූත ප්‍රයත්නයන් මෙරට සාර්ථක වීමට බලපෑ හේතු වචන 100 කින් පමණ විස්තර කරන්න. (ලකුණු 10 යි)

8. (i) ලන්දේසි පාලන සමයේ මෙරට ප්‍රගතියට මහත් සේ දායක වූ හිතකර ලක්ෂණ වචන 100 කින් පමණ සනාථ කරන්න. (ලකුණු 10 යි)
   (ii) භාග්‍යවත් ජුසේ වාස් පියතුමාගේ ධර්ම දූත සමයේ දී ජාකොමේ ගොන්සාල්වේස් පියතුමාගෙන් ලක් සසුනට සිදු වූ මෙහෙවර වචන 100 කින් පමණ විස්තර කරන්න. (ලකුණු 10 යි)

* * *